# 4 පරිච්ඡේදය

# සාර්ව ආර්ථික ඉදිරි දැක්ම

4

## සාරාංශය

සාර්ව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් වීමත්, දේශීය අවිනිශ්චිතතා ක්‍රමයෙන් පහව යාමත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකය වර්ධන මාවතක දිගට ම ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආර්ථිකයෙන් ඇති විය හැකි බාධා හේතුවෙන් ආර්ථිකයේ ඉදිරි ගමන් මගට බලපෑමක් ඇති විය හැකි වුව ද, එම කම්පනවලට පූර්වයෙන් සහ ප්‍රතිචාර වශයෙන් ගනු ලබන කාලෝචිත ප්‍රතිපත්ති පියවර මගින් එම අහිතකර බලපෑම් සීමා කරනු ඇත. අඩු හා ස්ථාවර උද්ධමනය, අඩු පොලී අනුපාතික පරිසරය, ධනාත්මක වෙළඳපොළ අපේක්ෂා සහ ස්ථාවර ආර්ථික හා දේශපාලන සාධක මගින් කෙටි කාලීන සහ මැදි කාලීන ආර්ථික වර්ධනයට රුකුලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වත්මන් අවධමනකාරී තත්ත්වය 2025 වසරේ පළමු භාගය තුළ දී පහව යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, උද්ධමනය මැදි කාලීනව ඉලක්කගත 5%ක මට්ටමට ආසන්නව ස්ථාවර වනු ඇත. භූ දේශපාලනික ගැටුම්, එක්සත් ජනපද රජයේ ප්‍රතිපත්ති ගැළපීම්වල බලපෑම් සහ අනෙකුත් ප්‍රධාන ආර්ථිකයන් විසින් ඒවාට එදිරිව ගන්නා පියවර මෙන්ම දේශගුණික විපර්යාස නිසා ඇතිවන කාලගුණික කැළඹීම් මගින් ආර්ථික වර්ධනය සහ උද්ධමනය පුරෝකථනවලින් අපගමනය වීමට අවදානම් ඇති විය හැකිය. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ඉදිරි දැක්මක් සහිතව සහ දත්ත මත පදනම්ව ක්‍රියාත්මක වනු ඇත. රජය විසින් විශාල වශයෙන් ණය ගැනීම නිසා පෞද්ගලික අංශයට සම්පත් සීමා වීමේ පීඩනය ලිහිල් වීම සහ අඩු පොලී අනුපාතික හේතුවෙන් පෞද්ගලික අංශයේ ණය වර්ධනය යහපත් මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂිතය. රාජ්‍ය අංශයට බැංකු අංශයේ නිරාවරණය අඩු මට්ටමක පවතිනු ඇති අතර, එයට රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්ය සාධනයෙහි අපේක්ෂිත දියුණුව බොහෝ දුරට සහාය වනු ඇත. විදේශීය අංශය සැලකූ විට, මෝටර් රථ ආනයනය සඳහා පනවා තිබූ සීමා ඉවත් කිරීම සහ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීම සමඟ වෙළඳ හිඟය පුළුල් වනු ඇතැයි අපේක්ෂා කරන නමුත්, විදේශ විනිමය ලැබීම්වල අපේක්ෂිත යහපත් වර්ධනයත් සමඟ එය කළමනාකරණය කළ හැකි මට්ටමක පවතිනු ඇත. ඉහළ යන සංචාරක ඉපැයීම්, අනෙකුත් සේවා අපනයන අංශවල ශක්තිමත් කාර්ය සාධනය, ප්‍රේෂණවල අඛණ්ඩ වර්ධනය සහ විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය අවසන් වීම නිසා ප්‍රාථමික ආදායම් ගිණුම මත ඇති පීඩනය ලිහිල් වීම හේතුවෙන් 2025 වසරේ දී අඛණ්ඩව තුන්වන වසරටත්, සුළු වශයෙන් හෝ, විදේශ ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2025 වසරෙන් පසුව ජංගම ගිණුමේ සෘණ ශේෂයක් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එය තිරසාර මට්ටමක පවතිනු ඇත. මේ අතර, ණය තිරසාරභාවය නැවත ස්ථාපිත කිරීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම හේතුවෙන් විදේශ මූල්‍ය ගිණුම වෙත වන ශුද්ධ ලැබීම් වර්ධනය වනු ඇත. මහ බැංකුව විසින් නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතර, බාහිර කම්පනවලින් ආර්ථිකයට ඇතිවන පීඩන අවම කිරීමට මැදි කාලීනව බාහිර ස්වාරක්ෂක ගොඩ නැඟීමට කටයුතු කරනු ඇත. පසුගිය වසර දෙක තුළ කැපී පෙනෙන දියුණුවක් වාර්තා කළ රාජ්‍ය මූල්‍ය අංශය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා වන නව නීති රාමුව සහ දැනට ක්‍රියාත්මක වන ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය මගින් ශක්තිමත් වී ඉදිරි වසරවල දී එහි යහපත් කාර්ය සාධනය දිගට ම පවත්වා ගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, වැඩිදියුණු වූ සාර්ව මූල්‍ය තත්ත්ව සමඟ ඉදිරි කාලය තුළ දී මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය යහපත්ව පවතිනු ඇතැයි අපේක්ෂිතය. ආර්ථික ක්‍රියාකාරකම් ස්ථාවරව යථා තත්ත්වයට පත් වීම සහ අඩු පොලී අනුපාතික ව්‍යුහය මධ්‍යයේ, ණය ගැතියන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව වැඩිදියුණු වීමත් සමඟ මූල්‍ය ආයතනවල ණය කළඹවල අවදානම් මට්ටම් අඩු වනු ඇත. මූල්‍ය අංශයේ අධීක්ෂණය වැඩිදියුණු කිරීම, එම අංශයේ සිදු කරන ඒකාබද්ධ කිරීම්, සහ නීතිමය හා නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව විසින් ගනු ලබන අඛණ්ඩ ප්‍රයත්න මගින්


**මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරනු ඇත. ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් වීම, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට මැදි කාලීනව තිරසාර වර්ධනයක් අත්කර ගැනීමට හැකි වනු ඇත.**

## 4.1 ගෝලීය ආර්ථික පරිසරය සහ ඉදිරි දැක්ම

**වෙළඳ ප්‍රතිපත්ති වෙනස් වීම සහ උත්සන්න වන භූ දේශපාලනික අර්බුද හේතුවෙන් භූ ආර්ථික බෙදීම් වැඩි වන අතර, ඒ හේතුවෙන් ගෝලීය වර්ධන අපේක්ෂා, මූල්‍ය තත්ත්ව සහ ජාත්‍යන්තර සහයෝගීතාවය මත බලපෑම් ඇති වන බැවින් ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා ඉහළ මට්ටමක පවතී.** 2025 වසරේ ජනවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ජා.මූ. අරමුදලෙහි ලෝක ආර්ථික ඉදිරි දැක්මෙහි (World Economic Outlook) යාවත්කාලීනය අනුව, 2023 වසරේ දී 3.3%ක් වූ ගෝලීය වර්ධනය, 2024 වසරේ දී 3.2%ක් දක්වා අඩු වනු ඇති බවට ඇස්තමේන්තු කර ඇති අතර, මෙතෙක් වාර්තා වූ (2000-2019) ආර්ථික වර්ධනයේ සාමාන්‍යය වන 3.7%කට වඩා අඩු මට්ටමක, එනම් 3.3%ක අගයක, 2025 සහ 2026 යන වසර දෙකෙහි ම ආර්ථික වර්ධනය පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ වෙතත්, එතැන් සිට මේ දක්වා ගෝලීය දේශපාලනික හා ආර්ථික පසුබිම සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති අතර, ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී මෙම පුරෝකථන සඳහා සංශෝධන එක් වීමට හැකියාවක් පවතියි. තවමත් පවතින අවිනිශ්චිතතාවයට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ එක්සත් ජනපද රජය වේගවත්ව සහ විශාල වශයෙන් සිදුකරන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වෙනස්කිරීම් සහ එයට ප්‍රතිචාර ලෙස අනෙක් රටවල් ගනු ලබන ප්‍රති-පියවරයන්ය. මෙම වාර්තාව සකස් කර අවසන් වන විට කිසිදු නිල නිවේදනයක් නිකුත් කර නොමැති වුවද, අන්‍යෝන්‍ය තීරුබදු (reciprocal tariff) ක්‍රමයක් පිළිබඳ ඇඟවීම් තිබේ. එමෙන්ම, එක්සත් ජනපද පරිපාලනය ඔවුන්ගේ නිෂ්පාදනය ඉහළ නැංවීම සහ රටේ වෙළඳ හිඟය අඩු කිරීම අරමුණු කර ගෙන ආනයන සඳහා ආදේශන හඳුන්වා දෙන ක්‍රමවේදයක් සකස් කර ඇති අතර, විදේශ ආධාර ලබා දීම, දේශගුණික විපර්යාස සහ තිරසාර සංවර්ධනයට අදාළ ඇතැම් ජාත්‍යන්තර වගකීම් කිහිපයකින් ඉවත් වීමට ද සැලසුම් කර ඇත.

**දැනට සිදු වෙමින් පවතින ගෝලීය ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතුවෙන් මතු වන වෙළඳ අවිනිශ්චිතතා, සැපයුම් දාම බාධා, උද්ධමනකාරී පීඩන සහ විදේශ ආධාර බෙදී යෑමේ හා ප්‍රාග්ධන ප්‍රවාහවල වෙනස්කම් නිසා ගෝලීය ආර්ථික ඉදිරි දැක්ම නැවත සකස් වනු ඇත.** එක්සත් ජනපද රජයේ ප්‍රතිපත්තිමය වෙනස්කම් හරහා නුදුරු කාලයේ දී ඇතිවන ප්‍රතිඵලවලින් එකක් ලෙස වෙළඳ අවිනිශ්චිතතා ඉහළ යනු ඇති අතර, එමගින් ගෝලීය වටිනාකම් දාම අවහිර වී ගෝලීය වෙළඳ ප්‍රවාහවල දැඩි වෙනසක් ඇති විය

4.1 රූප සටහන: ගෝලීය ආර්ථික ප්‍රතිපත්ති අවිනිශ්චිතතා දර්ශකය (Global Economic Policy Uncertainty Index)




මූලාශ්‍රය: Baker, Scott R.; Bloom, Nick; Davis, Stephen J. via Federal Reserve Economic Data

හැක. එක්සත් ජනපදයේ තීරු බදු ඉහළ යෑම නිසා බලපෑමට ලක් වූ ආර්ථිකයන් විසින් එයට එදිරිව වෙළඳ ක්‍රියාමාර්ග ගතහොත්, විශේෂයෙන් ම එම ක්‍රියාමාර්ග ගෝලීය ආයෝජන සහ වෙළඳාමට බාධාවක් වන ලෙස ක්‍රියා කළ හැකි බැවින් එයින් ගෝලීය වර්ධනය අඩු වීමක් ද සිදු විය හැක. 2025 වසරේ මාර්තු මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ෆෙඩරල් සංචිත බැංකුවේ නවතම ආර්ථික පුරෝකථන අනුව, 2024 වසරේ දී 2.5%ක ආර්ථික වර්ධන වේගයක් වාර්තා කළ එක්සත් ජනපදය 2025 වසර සඳහා 1.7%ක අඩු වර්ධනයක් අපේක්ෂා කරන අතර, එමගින් එක්සත් ජනපද නව තීරුබදු ක්‍රමවේදය සහ එයට එදිරිව අනෙකුත් ආර්ථිකයන් විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ගේ අපේක්ෂිත බලපෑම පිළිබිඹු කෙරේ. පිරිවැය ඉහළ යෑම සහ අපනයන තරඟකාරීත්වය පහත වැටීම හේතුවෙන් එක්සත් ජනපදය සමඟ ශක්තිමත් වෙළඳ සබඳතා සහිත රටවල් ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණ දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෙන ඇති තීරුබදු පියවර හේතුවෙන් යුරෝ කලාපීය ආර්ථිකයන්ට එල්ල වන සෘජු බලපෑම සීමිත වුවද, ඉහළ යන භූ දේශපාලනික සහ ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතා හේතුවෙන් කලාපයේ වර්ධන අපේක්ෂාවන්ට යම් අභියෝගයක් එල්ල විය හැකිය. චීනයේ සිදු විය හැකි තීව්‍ර රාජ්‍ය මූල්‍ය ලිහිල්කරණය කිරීම් තුළින්, එක්සත් ජනපද තීරුබදු ඉහළ නැංවීමෙන් චීනයේ කෙටි කාලීන වර්ධන අපේක්ෂාවන් කෙරෙහි ඇති විය හැකි බලපෑම යම් පමණකට අඩු විය හැකිය. එමෙන්ම, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ඒජන්සිය (USAID), ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සහ දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම ඇතුළු ජාත්‍යන්තර සංවිධානවලින් ඉවත් වීමට එක්සත් ජනපදය සැලසුම් කිරීම හේතුවෙන් දේශගුණික විපර්යාසය, සෞඛ්‍ය අර්බුද සහ තිරසාර සංවර්ධනය වැනි තීරණාත්මක ගැටලු විසඳීමට දරනු ලබන ගෝලීය ප්‍රයත්නයන්වලට බාධා ඇති විය හැක.

**තීරුබදු අඛණ්ඩව ඉහළ යෑමෙන් ගෝලීය නිර්-උද්ධමන ප්‍රවණතාවන්ට බාධා ඇති විය හැකි අතර, එමගින් උද්ධමන පීඩනය නැවත ඇති විය හැකිය.** අමුද්‍රව්‍ය සහ වානේ හා ඇලුමිනියම් වැනි වෙළඳ භාණ්ඩ මත තීරුබදු පැනවීම නිසා මිල උච්චාවචනයන් සහ උද්ධමන පීඩනයන් ඇති විය හැක. දුර්වල පාරිභෝගික ඉල්ලුම සහ මන්දගාමී වර්ධනය හේතුවෙන් තීරුබදුවලින් බලපෑමට ලක් වූ ඇතැම් ආර්ථිකයන් අඩු උද්ධමනයක් අත්විඳිය හැකි අතර, සමහර රටවල් එක්සත් ජනපදයට එදිරිව පැන වූ තීරුබදු හේතුවෙන් ඇතිවන සැපයුම් බාධා හා දුර්වල මුදල් ඒකක හේතුවෙන් උද්ධමන පීඩනවලට ලක් විය හැකිය. කෙසේ වෙතත්, චීනයේ ඉල්ලුම දුර්වල වීම, ගෝලීය බලශක්ති ඉල්ලුම දුර්වල වීම සහ එක්සත් ජනපදය ඇතුළු තෙල් අපනයනය කරන රටවලින් ඉහළ සැපයුමක් අපේක්ෂා කිරීම පිළිබිඹු කරමින් ඉදිරි වසර දෙක තුළ දී ගෝලීය බලශක්ති මිල ගණන් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහළ යන අවිනිශ්චිතතා සහ ඉහළ වෙළඳ පිරිවැය හේතුවෙන් වේතන හා මිල පීඩනයන් ඉහළ යෑමේ හැකියාව සැලකිල්ලට ගනිමින් ගෝලීය වශයෙන් මහ බැංකු සුපරීක්ෂාකාරීව සිටිනු ඇත. තීරුබදුවලින් බලපෑමට ලක් වූ රටවල සමහර මහ බැංකු මගින් ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම සඳහා පොලී අනුපාත අඩු කිරීම තෝරා ගත හැකි අතර, අනෙකුත් රටවල් විසින් යටිදැරි උද්ධමන පීඩනය දිගු කාලීනව පාලනය වීම සහතික කිරීම සඳහා මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම පිළිබඳව සලකා බැලිය හැකිය. කෙසේ වෙතත්, දිගු කාලීන ඉහළ පොලී අනුපාතිකවල අවදානම මගින් ගෝලීය මූල්‍ය තත්ත්ව සහ ප්‍රාග්ධන වෙළඳපොළවල් කෙරෙහි පීඩනයක් ඇති විය හැකිය.

**2024 මුල් කාලයේ දී බොහෝ දුරට දැඩිව පැවති ගෝලීය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීමත් උද්ධමනකාරී වාතාවරණය පහව යෑමත් සමඟ 2024 වසරේ අග භාගයේ දී සහ 2025 වසරේ මුල් කාලයේ දී ක්‍රමයෙන් ලිහිල් විය.** මතුපිට උද්ධමනයෙහි පහළ යෑමක් දක්නට ලැබුණ ද දියුණු ආර්ථිකයන්හි මහ බැංකු උද්ධමන පීඩන පාලනය වී ඇති බව මනාව පෙන්නුම් කරන තෙක් මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම ප්‍රමාද කළේය. තවද, මූලික උද්ධමනයෙහි පහළ යෑම මන්දගාමී වීම සහ ශක්තිමත් ශ්‍රම වෙළඳපොළ තත්ත්ව හේතුවෙන් 2024 වසරේ මුල් කාලයේ දී දියුණු ආර්ථිකයන්හි මහ බැංකු ඔවුන්ගේ මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී වඩාත් සුපරීක්ෂාකාරී ප්‍රවේශයක් අනුගමනය කළේය. කෙසේ වෙතත්, හිතකර උද්ධමන ඉදිරි දැක්මත් ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීමත් සමඟ 2024 වසරේ අග භාගයේ දී සහ 2025 වසරේ මුල් කාලයේ දී මුදල් ප්‍රතිපත්තිය ක්‍රමයෙන් ලිහිල් කිරීම් සිදු විය. මේ අතර, 2024 වසර සහ 2025 වසරේ මුල් කාලය තුළ දී නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මිශ්‍ර ස්වභාවයක් පෙන්නුම් කළේය. දුර්වල දේශීය ඉල්ලුම සහ අඩු උද්ධමනය හේතුවෙන් ඇතැම් මහ බැංකු ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කළ අතර, තවත් මහ බැංකු විසින් ආහාර හා බලශක්ති මිල ගණන් උච්චාවචනය වීමෙන් ඇතිවන උද්ධමන පීඩන පාලනය කිරීමට සහ ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා මධ්‍යයේ දේශීය විනිමය ස්ථාවරව පවත්වා ගැනීමට සිය මුදල් ප්‍රතිපත්තිය දැඩි ස්ථාවරයක පවත්වාගෙන යෑමට කටයුතු කරන ලදී. ඉදිරි කාලය තුළ දී, භූ දේශපාලනික අවිනිශ්චිතතා, ගෝලීය සැපයුම් දාම සඳහා වන බාධාවන්, විනිමය උච්චාවචනයන් සහ එමගින් උද්ධමනය කෙරෙහිවන බලපෑම වැනි සාධක ලොව පුරා මහ බැංකු විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය.

**ආරක්ෂණ ප්‍රතිපත්ති වැඩි වීම, භූ දේශපාලන අවිනිශ්චිතභාවය සහ දුර්වල ගෝලීය වර්ධන අපේක්ෂා, විවිධාකාර මාර්ග හරහා ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑ හැකිය.** වෙනස් වන එක්සත් ජනපද තීරුබදු ප්‍රතිපත්ති මගින් ශ්‍රී ලංකාවේ අපනයන රටාවලට බලපෑම් ඇති කළ හැකි බැවින්, අවධානය යොමු කළ යුතු මූලික අංශයක් වන්නේ භාණ්ඩ

4

වෙළඳාමයි. සාමාන්‍යයෙන්, ශ්‍රී ලංකාව එක්සත් ජනපදයට කරනු ලබන අපනයන සහ ආනයන, පිළිවෙළින්, එ.ජ. ඩොලර් බිලියන 3ක් සහ එ.ජ. ඩොලර් බිලියන 0.5ක් පමණ වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට වාසිදායක වන අන්දමින් එ.ජ. ඩොලර් බිලියන 2.5ක පමණ වෙළඳ අතිරික්තයක් ඇති වේ. එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා පනවන ලද සහ ක්‍රියාත්මක කරන ඕනෑම අන්‍යොන්‍ය තීරු බද්දකින් රටෙහි අපනයන අංශයට විශාල බලපෑමක් ඇති කළ හැකිය. මීට අමතරව, එක්සත් ජනපද රජයේ ප්‍රතිපත්ති ගැළපීම්වලින් ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ට ඇති විය හැකි බලපෑමෙන් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා අහිතකර බලපෑමක් ඇති විය හැකිය. පුරෝකථනය කරන ලද පරිදි ගෝලීය තෙල් මිලෙහි පහත වැටීම වෙළඳ ශේෂය මත ධනාත්මක බලපෑමක් ඇති කළ හැකිය. කෙසේ වෙතත්, එක්සත් ජනපද රජයේ තීරුබදු ප්‍රතිපත්ති හේතුවෙන් ගෝලීය ආර්ථිකයේ ඇතිවිය හැකි පසුබෑම හේතුවෙන් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට බලපෑම් ඇති විය හැකිය. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රධාන මූලාශ්‍ර රටවල ආර්ථික වර්ධනය දිගුකාලීනව අඩුවීම, සංචාරක ක්ෂේත්‍රයේ දැනට නිරීක්ෂණය වන ධනාත්මක ප්‍රවණතාවට බලපෑ හැකිය. එක්සත් ජනපදය විසින් ප්‍රතිපත්ති වෙනස් කිරීම හේතුවෙන් ගෝලීය මුදල් ප්‍රතිපත්ති වෙනස්වීම් නිසා මුදල් තත්ත්වයන්ට බලපෑම් ඇති විය හැකි අතර ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළඳපොළ වෙත මූල්‍ය ප්‍රවාහයන්ට ද බලපෑම් එල්ල විය හැකිය. මෙම වාර්තාව සකස් කර අවසන් වන විට එක්සත් ජනපද ආර්ථික ප්‍රතිපත්ති සහ ඒවායේ බලපෑම අවිනිශ්චිත සහ පුරෝකතනය කළ නොහැකි තත්ත්වයක පවතී.


**වෙනස්වීම්වලට ලක් වෙමින් පවතින ගෝලීය ප්‍රතිපත්ති සහ ඒවායේ බලපෑම් කළමනාකරණය කිරීම සඳහා ප්‍රවේශම් සහගත ප්‍රවේශයක් ලොව පුරා රටවල් අනුගමනය කරයි.** ගෝලීය පරිසරයේ අවිනිශ්චිතතාවය සැලකිල්ලට ගෙන, නව නිදහස් වෙළඳ ගිවිසුම් සක්‍රීයව ක්‍රියාත්මක කිරීම සහ භාණ්ඩ වෙළඳාම් විතැන් වීමේ අවස්ථා ශ්‍රී ලංකාවට වාසිදායක වන පරිදි යොදා ගැනීම සඳහා ප්‍රතිපත්තිමය සූදානම ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වේ. අන්‍යොන්‍ය තීරුබදු පිළිබඳව සලකා බලා තීරුබදු ව්‍යුහයන් නැවත සමාලෝචනය කිරීම අත්‍යවශ්‍ය වන අතර, ඉක්මනින් මැදිහත්වීම සඳහා මතුවිය හැකි සාර්ව ආර්ථික අවදානම් සමීපව නිරීක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. ආර්ථික බෙදී යෑම් තීව්‍ර වන විට, යම් වෙළඳපොළක් මත යැපීම අඩු කිරීමට සහ සිය කලාපය තුළ වෙළඳාම වර්ධනය කිරීමට, කලාපීය වෙළඳ සන්ධාන සහ සම මට්ටමේ පවතින රටවල් අතර සහයෝගීතා ශක්තිමත් කිරීමට රටවල් සලකා බලයි. අනෙක් අතට, අනාගත කම්පනවලට ප්‍රතිචාර දැක්වීමට රජයන්ට ඇති හැකියාව පවත්වා ගැනීම සහ වර්තමාන සහ අනාගත වියදම් පීඩන දරා ගැනීම සඳහා ණය තිරසර බව සහතික කිරීමට රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීම අවශ්‍ය වේ.

## 4.2 දේශීය ආර්ථිකයේ ඉදිරි දැක්ම

### 4.2.1 උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම

**2024 වසරේ අවසාන කාලයේ සිට 2025 වසරේ මුල් කාලය දක්වා අවධමන කාලපරිච්ඡේදයකින් පසුව, 2025 වසර මැද වන විට, මතුපිට උද්ධමනය ධන අගයකට පත් වී, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහායයෙන් මැදි කාලීනව 5%ක ඉලක්කය ආසන්නයේ ස්ථායී වනු ඇතැයි පුරෝකථනය කර ඇත.** 2024 වසර අවසානය වන විට දක්නට ලැබුණු අවධමනකාරී තත්ත්වය 2025 වසරේ මුල් මාස තුනෙහි දී ද පැවතුණි. 2025 වසරේ පළමු කාර්තුවේ අවධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) 2024 වසර අවසානයේ වාර්තා වූ අවධමනයට වඩා වැඩි විය. මේ සඳහා, ප්‍රධාන වශයෙන් ම, වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය පහළ යෑමට දායක වූ සංඛ්‍යානමය පදනම් බලපෑම හේතු විය. මීට අමතරව, 2025 වසරේ ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි විදුලි ගාස්තු සැලකිය යුතු ලෙස පහළ දැමීම ද 2025 වසරේ පළමු කාර්තුවේ අවධමනය සඳහා දායක විය. කෙසේ වෙතත්, මතුපිට උද්ධමනය අවධමන තත්ත්වයේ සිට ඉහළ ගොස් 2025 වසර මැද භාගය වන විට ධන අගයකට පත්වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ලෝක ආහාර උද්ධමනයේ ඉහළ යෑම, ඉල්ලුම් පීඩන ක්‍රමයෙන් වර්ධනය වීම සහ සංඛ්‍යානමය පදනම් බලපෑම මතුපිට උද්ධමනයේ මෙම ඉහළ යෑම සඳහා දායකවනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2026 වසරේ දෙවන භාගය දක්වා මතුපිට උද්ධමනයේ ක්‍රමානුකූල ඉහළ යෑමක් වත්මන් පුරෝකථනවලින් පෙන්නුම් කෙරේ. කෙසේ වෙතත්, මතුපිට උද්ධමනය ඉහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා නොකරන අතර, 2026 වසරේ අවසාන කාලයේ සිට එය ක්‍රමානුකූලව පහළ ගොස් අවසානයේ සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, මැදි කාලීනව 5%ක ඉලක්කගත මට්ටම ආසන්නයේ ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, යටිදැරි ඉල්ලුම් පීඩන හඳුනාගැනීමට උපකාරී වන, නිතර මිල උච්චාවචන සහිත භාණ්ඩ හා සේවා ඉවත් කිරීමෙන් පසු මනිනු ලබන මූලික උද්ධමනය, මැදි කාලීනව සමස්තයක් ලෙස ස්ථායීව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මතුපිට උද්ධමනයට සමානව, මූලික උද්ධමනයේ හැසිරීම කෙරෙහිද, 2025 වසරේ පළමු කාර්තුවේ දී සංඛ්‍යානමය පදනම් බලපෑම හේතු වී ඇත. මෙය මූලික උද්ධමනයේ තාවකාලික පහළ යෑමට හේතු විය. කෙසේ වෙතත්, මතුපිට උද්ධමනය පහළ යෑමට හේතු වන බලශක්ති සහ ප්‍රවාහන ආශ්‍රිත කාණ්ඩයේ අයිතම බොහෝ දුරට මූලික උද්ධමන දර්ශකයෙන් බැහැර කරන බැවින්, මතුපිට උද්ධමනයේ මෑත කාලීන පහළ යෑම මූලික උද්ධමනයේ ඒ ආකාරයෙන් ම පිළිබිඹු නොවේ. ඉදිරි කාලපරිච්ඡේදයේ දී, මූලික උද්ධමනය, මතුපිට උද්ධමනය සඳහා වන ඉලක්කයට අනුකූලව, අඩු විචලනයක් සහිතව සාමාන්‍ය තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දැනට අපේක්ෂා කර ඇති පරිදි ස්ථාවර ලෙස

**4.2 රූප සටහන: මතුපිට උද්ධමනයේ පුරෝකථන* (කාර්තුමය සාමාන්‍යය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)**




*උද්ධමන ව්‍යාප්ති සටහනෙහි 2022 වසරේ සිව්වන කාර්තුවේ වාර්තා කරන ලද දත්ත කො.පා.මි.ද. (2013=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කො.පා.මි.ද. (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ.

**සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ.**
2025 වසරේ මාර්තු මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති දත්ත, උපකල්පන සහ විනිශ්චයන් පුරෝකථන මගින් පිළිබිඹු කරයි.

උද්ධමන ව්‍යාප්ති සටහන මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. රූපසටහනේ දැක්වෙන විශ්‍රම්භ ප්‍රාන්තර (Confidence Intervals, CI) මගින් මැදිකාලීන උද්ධමනය විචලනය විය හැකි අගය පරාසයන් දක්වයි. උදාහරණයක් ලෙස, තද කොළ පැහැති ප්‍රදේශය 50% විශ්‍රම්භ ප්‍රාන්තරය නිරූපණය කරන අතර, එමගින් උද්ධමනයේ සැබෑ අගය මෙම පරාසය තුළ පැවතීමේ 50%ක සම්භාවිතාවක් පවතින බව හඟවනු ලබයි. විශ්‍රම්භ පරාසයන් මගින් උද්ධමනය දීර්ඝ කාලයකට පුරෝකථනය කිරීමේදී ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයේ ඉහළ යෑම පෙන්නුම් කරයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම මධ්‍යයේ, ඉල්ලුම් තත්ත්ව ක්‍රමානුකූලව වැඩිදියුණු වීම මූලික උද්ධමනයේ දිශානතියට රුකුලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**පවතින ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා සහ අහිතකර දේශීය කාලගුණික තත්ත්ව මධ්‍යයේ වර්තමාන පුරෝකථන සඳහා වන අවදානම් සාමාන්‍ය කාලයන්ට වඩා ඉහළ මට්ටමක පවතී.** ගෝලීය බලශක්ති හා ආහාර මිල ගණන් පිළිබඳ පුරෝකථන, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ අපේක්ෂිත ආර්ථික ගමන් මග, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ පුරෝකථන අනුව අපේක්ෂිත දේශීය රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම, විදුලිබල සහ ඉන්ධන මිල ගණන් පිරිවැය නිරූපණය වන ලෙස පවතිනු ඇති බවට වන උපකල්පනය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මගින් නිරූපණය වන ගෝලීය මූල්‍ය තත්ත්ව මත මෙම පුරෝකථන රඳා පවතී. එසේම, ආර්ථික ආකෘතිය මගින් ලබා දෙන පොලී අනුපාතික මාර්ගය සහ ඒ හා සබැඳි සාර්ව ආර්ථික විචල්‍යයන්හි හැසිරීම මත පුරෝකථන රඳා පවතී. තවද, මූලික පුරෝකථන සඳහා සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවලින් සැලකිය යුතු විතැන් වීම් අපේක්ෂා නොකෙරේ. පුරෝකථන සඳහා භාවිතා කර ඇති උපකල්පන සහ විනිශ්චයන්හි සිදුවන සැලකිය යුතු මට්ටමේ වෙනස්කම්, සැබෑ උද්ධමනය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය. පුරෝකථන සඳහා ඍජුව හෝ වක්‍රව භාවිතා වන විවිධ සාධක ඒවායේ දැනට සලකා ඇති මට්ටම්වලින් අපගමනය වීමේ හැකියාව සහ කිසියම් අනපේක්ෂිත වර්ධන හේතුවෙන් පුරෝකථන සඳහා අවිනිශ්චිතතා හට ගනී. විශේෂයෙන් ම, ඉහළ වැටුප් හේතුවෙන් ඇති විය හැකි ඉල්ලුමේ බලපෑම, ඇති විය හැකි අයහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදනයට සිදු වන බලපෑම, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාර්ගයෙන් යම් අපගමනයක් සිදු වීමට ඇති හැකියාව සහ රුපියල ඉහළ මට්ටම්වලින් අවප්‍රමාණය වීමට ඇති හැකියාව වැනි සාධක මගින් උද්ධමනය පුරෝකථනය කළ මාර්ගයට වඩා ඉහළ යෑම සඳහා සැලකිය යුතු මට්ටමේ බලපෑම් ඇති කළ හැකිය. මේ අතර, උද්ධමන පුරෝකථන පහළ යෑමේ අවදානම් සැලකූවිට, අනෙකුත් සාධක අතර, ගෝලීය ආර්ථික වර්ධනය මන්දගාමී වීම හේතුවෙන් ගෝලීය වෙළඳ භාණ්ඩ මිල තවදුරටත් පහළ යෑමට ඇති හැකියාව ඇතුළත් වේ. නම්‍යශීලි උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ, දත්ත මත පදනම් වූ මුදල් ප්‍රතිපත්ති සම්පාදනය හරහා දේශීය හා ගෝලීය ආර්ථික තත්ත්වයන්හි ඉදිරි වෙනස්වීම් මත පදනම්ව, උද්ධමන ඉදිරි දැක්මෙහි ඇති විය හැකි අපගමනයන් පිළිබඳව සෑම මුදල් ප්‍රතිපත්ති වාරයක දී ම මහ බැංකුව විසින් මහජනතාව වෙත අඛණ්ඩව සන්නිවේදනය කරනු ඇත.

4

### 4.2.2 මුදල් අංශයේ ඉදිරි දැක්ම

**දේශීය ආර්ථිකයේ ප්‍රවණතා සහ වෙනස්වන ගෝලීය ආර්ථික තත්ත්ව මගින් ඇති විය හැකි බලපෑම් සැලකිල්ලට ගනිමින් මහ බැංකුව ඉදිරියේ දී දත්ත මත පදනම් වූ ප්‍රවේශයක් මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ දී අනුගමනය කරනු ඇත.** සැපයුම් අංශයේ සාධක හේතුවෙන් තාවකාලිකව ඇති වූ අවධමන තත්ත්වයෙන් පසුව 2025 වසර අග භාගයේ දී උද්ධමනය ඉලක්කකගත මට්ටම කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කරන අතර, උද්ධමන ඉලක්කය ළඟා කර ගැනීම සඳහා මැදි කාලීනව ඇති විය හැකි බාධා වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා මහ බැංකුව ඉල්ලුම් අංශයෙන් ඇතිවිය හැකි අවදානම් සමීපව නිරීක්ෂණය කරනු ඇත. තවද, එක්සත් ජනපද රජය විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති හේතුවෙන් ගෝලීය වශයෙන් ඇතිවන වෙනස්වන ආර්ථික හා මූල්‍ය පරිසරය මෙන්ම ඒ ආශ්‍රිත අවිනිශ්චිතතා මගින් දේශීය ආර්ථිකයට සහ මුදල් ප්‍රතිපත්ති සම්පාදනයට බලපෑම් ඇති කළ හැකිය. මේ අතර, දේශීය වෙළඳපොළ පොලී අනුපාතික පහළ මට්ටමක ස්ථායිව පවතිනු ඇති අතර, දැනට ඉහළ මට්ටමක පවතින ඇතැම් ණය උපකරණ සඳහා වන පොලී අනුපාතික තවදුරටත් අඩු වනු ඇත. තවද, ලිහිල් මුදල් ප්‍රතිපත්තිය, වැඩිදියුණු වූ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සහ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ යෑමත් සමඟ අවදානම් අධිමිල අඩු වීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත එළදා අනුපාතික අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ලිහිල් මුදල් තත්ත්වයන්ගේ සහාය ඇතිව ඉදිරි කාලය තුළ දී මුදල් ප්‍රසාරණය අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.** අඩු පොලී අනුපාතික මට්ටම් ව්‍යාපාර සහ කුටුම්භ සඳහා ණය ගැනීමේ පිරිවැය අඩු කරනු ඇති අතර, එමගින් ආනයන ඉල්ලුම ඉහළ යෑම සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු වීම මධ්‍යයේ පරිභෝජනය සඳහා මෙන්ම ආර්ථිකයේ අනෙකුත් ඵලදායී අංශ සඳහා ණය ප්‍රවාහ ගලායෑම ඉහළ නැංවෙනු ඇත. මේ අතර, රාජ්‍ය මූල්‍ය කර්යසාධනයේ අපේක්ෂිත වැඩිදියුණු වීම් මෙන්ම රජය සතු වාණිජ ව්‍යාපාරයන්හි අඛණ්ඩ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය හේතුවෙන් රාජ්‍ය අංශය අරමුදල් අවශ්‍යතා සඳහා බැංකු අංශය මගින් ණය ලබා ගැනීම අඩු වනු ඇතැයි අපේක්ෂා කරන අතර එමගින් පෞද්ගලික අංශයට වැඩි වශයෙන් ණය ලබා ගැනීම සඳහා අවස්ථාව සැලසෙනු ඇත. රජයේ සුරැකුම්පත් මත එළදා අනුපාතිකවල විචලන ස්ථායි කිරීම සඳහා ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක පවත්වා ගැනීම රජය විසින් සහතික කළ යුතුය. මේ අතර, විදේශ සංචිත තත්ත්වය ඉහළ නැංවීම සඳහා මහ බැංකුව විසින් විදේශ විනිමය මිලදී ගැනීම අඛණ්ඩව සිදු කිරීම තුළින් ඉදිරි කාලය තුළ දී බැංකු පද්ධතියේ විදේශීය වත්කම් තවදුරටත් ඉහළ නැංවෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින්, ඇතිවිය හැකි බාහිර කම්පනවලට ඔරොත්තු දීම සඳහා වන ස්වාරක්ෂක ශක්තිමත් කෙරෙනු ඇත. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මෙන්ම නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමවේදය සමඟ පූර්වෝපායික මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ කොටසක් ලෙස විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ මහජන විශ්වාසය වර්ධනය කිරීම සඳහා මහ බැංකුව සිය ප්‍රතිපත්ති සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳව අඛණ්ඩව සන්නිවේදනය කරනු ඇත. සන්නිවේදන ප්‍රයත්න ශක්තිමත් කිරීම මහජන අපේක්ෂා කළමනාකරණය කිරීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇති අතර, එමගින් මිල ස්ථායිතාව මෙන්ම පුළුල් සාර්ව ආර්ථික ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීමට සහාය වනු ඇත. මෙම ක්‍රියාමාර්ගවල අංගයක් ලෙස සියලුම පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම සඳහා අනෙකුත් කාලීන ප්‍රකාශන සහ නිවේදනවලට අමතරව මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති වාර්තාව අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත.

### 4.2.3 විදේශීය අංශයේ ඉදිරි දැක්ම

**ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තුළ අභියෝගවලට මුහුණ දීමේ හැකියාව කෙටි කාලීනව අඛණ්ඩව පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කරන අතර, අභියෝගාත්මක ගෝලීය ආර්ථික ඉදිරි දැක්ම හමුවේ සිදුවිය හැකි ඕනෑම අහිතකර ප්‍රතිවිපාකවලට මුහුණ දීම සඳහා කාලෝචිත ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.** ස්ථාවර දේශීය සමාජ ආර්ථික හා දේශපාලන පරිසරයක් මධ්‍යයේ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන සාර්ථකව අඛණ්ඩව පවත්වාගෙන යාම සහ විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම, කෙටි කාලීනව විදේශීය අංශයේ ඉදිරි දැක්මට සහාය වනු ඇත. කෙසේ වෙතත්, එක්සත් ජනපදයේ විදේශ ප්‍රතිපත්තිවල අපේක්ෂිත වෙනස්කම් සමඟ විදේශීය අංශයේ කෙටි කාලීන අවිනිශ්චිතතා ඇති විය හැකිය. ශ්‍රී ලංකාවේ විදේශීය අංශයට මෙමගින් ඇති විය හැකි සෘජු හා වක්‍ර බලපෑම් අවිනිශ්චිත වේ. විදේශීය ජංගම ගිණුමේ මෑත කාලීන ප්‍රවණතා සහ දැනට පවතින තොරතුරුවලින් පෙනී යන්නේ 2025 වසරේ දී ද ජංගම ගිණුමෙහි අතිරික්තයක් වාර්තා වනු ඇති බවයි. කෙසේ වෙතත්, මෙම ඉදිරි දැක්ම කෙරෙහි ගෝලීය අභියෝග සහ මෙම අභියෝගවලට දේශීයව දක්වන ප්‍රතිචාර මගින් බලපෑම් ඇති කෙරෙනු ඇත.

**2025 වසරේ දී, ආනයන සීමා ලිහිල් කිරීම මෙන්ම වැඩිදියුණු වූ ආර්ථික ක්‍රියාකාරකම් සහ ලිහිල් මූල්‍ය තත්ත්ව මධ්‍යයේ ව්‍යාපාර හා ගෘහ ඒකකවල වියදම් කිරීමේ හැකියාව ඉහළ යෑම පිළිබිඹු කරමින් ආනයන ඉල්ලුම වැඩි වීම හේතුවෙන් වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය පුළුල් වනු ඇතැයි පුරෝකථනය කර ඇත.** කෙටි කාලීනව වාහන ආනයන සඳහා ඉල්ලුම අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු මට්ටමක පැවතිය ද, ඉල්ලුම ක්‍රමයෙන් ඉහළ යෑමට ඇති හැකියාව බැහැර කළ නොහැක. 2025 වසරේ දී ගෝලීය බොරතෙල් මිල අඩු වනු ඇතැයි පුරෝකථනය කර තිබුණ ද, දේශීය ආර්ථික

ක්‍රියාකාරකම්වල අපේක්ෂිත යථා තත්ත්වයට පත් වීම නිසා ඇති විය හැකි ඉල්ලුම් පරිමාවන්හි වැඩි වීම සහ භූ දේශපාලනික ආතතීන් හේතුවෙන් ඇති විය හැකි අහිතකර මිල උච්චාවචනයන් හේතුවෙන් 2024 වසරට සාපේක්ෂව තරමක් ඉහළ බනිජ තෙල් ආනයන වියදමක් 2025 වසර සඳහා ඇස්තමේන්තු කර ඇත. එමෙන්ම, ආර්ථික ක්‍රියාකාරකම්වල අපේක්ෂිත යථා තත්ත්වයට පත් වීමට අනුකූලව 2025 වසරේ දී අනෙකුත් අතරමැදි භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ සඳහා වන වියදම් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. සමස්තයක් වශයෙන්, ආනයනවල අඛණ්ඩ වර්ධනයක් තිබියදීත්, අපනයනවල ස්ථාවර වර්ධනයෙහි දායකත්වයෙන් මැදි කාලීනව වෙළඳ හිඟය කළමනාකරණය කළ හැකි මට්ටම්වල පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංචාරක ඉපැයීම් ඉහළ යෑම සහ අනෙකුත් සේවා අපනයනවල තරගකාරීත්වය වැඩිදියුණු වීම හේතුවෙන් සේවා ගිණුමේ අතිරික්තය 2025 වසරේ දී සහ මැදි කාලීනව තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂිතය. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සඳහා ගෝලීය පිළිගැනීම සහ ආංශික විභවතාවය උපරිම කිරීම සඳහා අඛණ්ඩව පියවර ගැනීමේ දායකත්වයෙන් සංචාරක අංශයේ පවතින ඉහළ වර්ධනයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට ශ්‍රී ලංකාව සූදානමින් සිටී. මීට අමතරව, මුහුදු හා ගුවන් ප්‍රවාහන සේවා අංශයන්හි නැවත යථා තත්ත්වයට පත් වීම සහ තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ අංශයෙහි ශක්තිමත් ක්‍රියාකාරිත්වය සේවා ගිණුමේ අතිරික්තයට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉදිකිරීම්, කළමනාකරණ උපදේශන සහ ගෘහ නිර්මාණ හා ඉංජිනේරු සේවා වැනි අනෙකුත් සේවා අංශ ද මැදි කාලීනව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂිතය. ඉහළ විභවතාවයක් සහිත මෙම නැගී එන අංශ ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම රටට සම්පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා කාලෝචිත වේ. විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු පොලී ගෙවීම් අඩු වීම හේතුවෙන් 2025 වසරේ දී ප්‍රාථමික ආදායමේ ගිණුමේ හිඟය අඩු වීමේ හැකියාවක් ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ආයෝජනය කර ඇති සෘජු ආයෝජන ව්‍යාපාර විසින් අඛණ්ඩව ලාභාංශ ගෙවීම් සහ පොලී ගෙවීම් හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීම් ක්‍රමයෙන් වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, විදේශ රැකියා සඳහා පිටත්වීම්වල අඛණ්ඩ ප්‍රවණතාව සහ සංක්‍රමණික සේවකයින් විසින් මුදල් හුවමාරුව සඳහා විධිමත් මාර්ග භාවිතා කිරීම වැඩි වීම හේතුවෙන් 2025 වසරේ දී සහ ඉන් ඔබ්බට විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ක්‍රමයෙන් වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සමස්තයක් වශයෙන්, 2025 වසරේ දී ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, වාහන ආනයන සීමා ලිහිල් කිරීම මගින් සිදුවන බලපෑමෙහි විශාලත්වය මත එය පදනම් වේ. කෙසේ වෙතත්, මැදි කාලීනව ජංගම ගිණුමේ හිඟයන් තිරසාර මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ධනාත්මක ආයෝජක අපේක්ෂා සහ ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ මගින් මූල්‍ය ගිණුම වෙත ලැබීම් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** කෙසේ වෙතත්, ගෝලීය වර්ධනයේ සහ මූල්‍ය තත්ත්ව පිළිබඳ අපේක්ෂාවන්හි අපැහැදිලිතා සමඟ ආයෝජන අවිනිශ්චිතතාවයක් ඇති වීමට ඉඩ ඇති බැවින්, මූල්‍ය ගිණුම වෙත වන සමස්ත ලැබීම් කෙටි කාලීනව අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම බාධාවන් තිබියදීත්, ඉදිරි කාලය තුළ දී ද්විපාර්ශ්වික මූල්‍යයන පහසුකම් නැවත ආරම්භ කිරීමට සමගාමීව, කෙටි හා මැදි කාලීනව බහුපාර්ශ්වික ආයතනවලින් විදේශීය මූල්‍යයන සහාය අපේක්ෂිතය. මෙම ලැබීම් මූල්‍ය ගිණුමට සහාය වෙනවා පමණක් නොව, 2025 වසරේ දී සහ ඉන් ඔබ්බට දළ නිල සංචිත ශක්තිමත් කිරීමට ද දායක වනු ඇත. ආයෝජන පරිසරය වැඩිදියුණු කිරීමට ඒකාබද්ධව ගනු ලබන ප්‍රයත්න ක්‍රියාත්මක වීම මගින්, මෑත වසරවල අඩු මට්ටම්වල පැවති ණය නොවන විදේශීය ලැබීම්, විශේෂයෙන් විදේශීය සෘජු ආයෝජන, ආකර්ෂණය කිරීමට හැකි වනු ඇතැයි පුරෝකථනය කෙරේ. රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන මධ්‍යස්ථව පවතිනු ඇතැයි අපේක්ෂිතය. තවද, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් අපේක්ෂිත ශුද්ධ මිලදී ගැනීම් හේතුවෙන් මහ බැංකුවේ දළ නිල සංචිත ක්‍රමයෙන් වැඩිදියුණු වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, මහ බැංකුව විදේශීය වගකීම් අඛණ්ඩව අඩු කරමින් සිටියි. මැදි කාලීනව ගෙවුම් තුලනය සහ විනිමය අනුපාතිකය මත පීඩනයක් ඇති කළ හැකි ආකාරයට ආනයනවල ඇති විය හැකි ඉහළ යෑම, ඉදිරියේ දී සිදුකළ යුතු ණය ආපසු ගෙවීම් සහ ගෝලීය භූ දේශපාලනික වර්ධනයන් හේතුවෙන් විදේශීය අංශයට ඇති විය හැකි අවදානම් අවම කිරීම සඳහා විදේශීය සංචිත ස්වාරක්ෂක ගොඩනැගීමට මහ බැංකුව සුපරීක්ෂාකාරීව කටයුතු කරයි.

### 4.2.4 මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම

**සාර්ව ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ධනාත්මක බලපෑම, ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මෙන්ම, මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ සමඟ, 2025 වසරේ දී මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම, වෙළෙඳාම සම්බන්ධ සීමා ලිහිල් කිරීම සහ සාර්ව ආර්ථික පරිසරයේ වැඩිදියුණු වීමත් සමඟ 2024 වසරේ දී බැංකු සහ මුදල් සමාගම් යන අංශ දෙකෙහි ම ණය වර්ධනය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම ආරම්භ විය. දිගු කාලීන සංකෝචනය වීමකින් අනතුරුව පෞද්ගලික අංශයට ලබාදුන් ණය නැවත යථා තත්ත්වයට පත්වීමත් සමඟ ණය චක්‍රය ප්‍රසාරණ අවධියකට සංක්‍රමණය විය. හිතකර සාර්ව ආර්ථික දැක්මෙහි අඛණ්ඩ පැවැත්ම සහ අඩු පොලී අනුපාත මගින්, පෞද්ගලික අංශයට ලබාදුන් ණය තවදුරටත් ප්‍රසාරණය වී ණය චක්‍රය ද ප්‍රසාරණ

අවධිය තුළ තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකු සහ මුදල් සමාගම් යන අංශ දෙකෙහි ම ණය තවදුරටත් ප්‍රසාරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින්, ණය චක්‍රයේ ප්‍රසාරණ අවධියේ දී ඇතිවිය හැකි පද්ධතිමය අවදානම් අවම කිරීම සඳහා මහ බැංකුව විසින් මූල්‍ය පද්ධතිය සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවන්හි දී සාර්ව විචක්ෂණතා ප්‍රතිපත්ති භාවිත කරනු ඇත. තවද, පෞද්ගලික අංශයට ලබාදුන් ණය වැඩි වීමත් සමඟ මූල්‍ය ආයතන රජයට ණය ලබාදීමේ නැඹුරුව නිවැරදි වීමේ සලකුණු 2024 වසරේ දී පෙන්නුම් කළේය. කුටුම්භ සහ ආයතනික අංශවල ණය ඉල්ලුමේ අපේක්ෂිත වර්ධනයත් සමඟ රාජ්‍ය අංශය වෙත ඇති ස්වෛරීත්ව ණය නිරාවරණ තවදුරටත් පහළ වැටීමක් අපේක්ෂා කෙරේ. විශාල ගනුදෙනු නිරාවරණයවීම් පිළිබඳ විධානයන් ක්‍රමානුකූලව අනුගමනය කිරීම තුළින් ද බලපත්‍රලාභී බැංකු රාජ්‍ය ව්‍යවසායයන් වෙත නිරාවරණය වීම අවම වනු ඇති අතර එමගින් ස්වෛරී-බැංකු සම්බන්ධතාවය අවම කෙරේ. රාජ්‍ය ව්‍යවසායයන්හි ණය ඇතුළුව ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම බැංකු අංශයට අවම බලපෑම් සහිතව සම්පූර්ණ කර ඇතත්, බැංකු විසින් තවදුරටත් ස්වෛරී-බැංකු සම්බන්ධතාවය පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කළ යුතුය. ආර්ථික ක්‍රියාකාරකම්හි යථා තත්ත්වයට පත්වීම සහ සාපේක්ෂව අඩු පොලී අනුපාත සහිත පරිසරයක් තුළ ණය ගැතියන්ගේ ආපසු ගෙවීමේ හැකියාව වැඩිදියුණු වීමත් සමඟ බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම්වල ණය කළඹෙහි ගුණාත්මකභාවය තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම මගින් බැංකුවල ද්‍රවශීල නොවන විදේශ විනිමය ස්වෛරීත්ව උපකරණ වෙනුවට ද්‍රවශීල විදේශ විනිමය ස්වෛරීත්ව උපකරණ හුවමාරු කෙරුණු අතර, එමගින් බැංකුවල විදේශ විනිමය ද්‍රවශීලතා මට්ටම් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කර තිබේ. කෙසේ වෙතත්, විනිමය අනුපාතික උච්චාවචනයන්, බාහිර අසමතුලිතතා සහ විදේශ විනිමය හිඟයන් ආශ්‍රිත අවදානම්වලින් ආරක්ෂා වීම සඳහා බැංකු තම විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වයන් විචක්ෂණශීලීව කළමනාකරණය කළ යුතුය. 2024 වසර තුළ දී බැංකු අංශයේ ලාභදායීත්වය ඉහළ ගිය අතර, හිතකර සාර්ව මූල්‍ය තත්ත්වයන් මධ්‍යයේ, ලාභදායීත්වය පිළිබඳ ඉදිරි දැක්ම සුභවාදී වනු ඇත. තවද, මෑත කාලීනව බැංකු විසින් වාර්තා කරන ලද මෙහෙයුම් අවදානම් ආශ්‍රිතව සිදු වූ සිදුවීම් සලකා බැලීමේ දී සහ තාක්ෂණය පදනම් කරගත් උපකරණ මත යැපීම වැඩිවීම හේතුවෙන්, තොරතුරු තාක්ෂණය ආශ්‍රිත අවදානම් ඇතිවීමේ අවදානම අවම කිරීමට තොරතුරු තාක්ෂණ පද්ධති සහ සයිබර් ආරක්ෂාව සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීම අත්‍යවශ්‍ය වේ.

4

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු සඳහා නිරාකරණ සැලසුම් සකස් කෙරෙමින් පවතින අතර, මූල්‍ය සමාගම් සඳහා නිරාකරණ රාමුවක් පිහිටුවීමට මූල්‍ය ව්‍යාපාර පනත සංශෝධනය කිරීමට කටයුතු සිදුකෙරෙමින් පවතී.** තවද, රජයේ සහාය ඇතිව මූල්‍ය ස්ථායීත්ව අරමුදල ශක්තිමත් කිරීම සඳහා ද ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. ලෝක බැංකුවේ අනුග්‍රහයෙන් සිදු කරන ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණය සහ මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ වන ප්‍රතිපත්ති පාදක වැඩිදියුණු කිරීම් තුළින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මූල්‍ය සහ ආයතනික ධාරිතාව ශක්තිමත් කෙරේ. තවද, වැඩි දියුණු කළ පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලි, වෙළඳපොළ හැසිරීම අධීක්ෂණය සහ මූල්‍ය පාරිභෝගික අධ්‍යාපනය තුළින් මහ බැංකුව විසින් මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව අඛණ්ඩව ශක්තිමත් කරනු ඇත.

**මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා පුළුල් පරාසයකින් යුතු ව්‍යුහාත්මක, නෛතික සහ ප්‍රතිපත්ති මට්ටමේ ප්‍රතිසංස්කරණ සහ නවෝත්පාදනයන් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇත.** බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධකරණ සැලැස්මෙහි පළමු අදියර සාර්ථකව නිම කිරීමත් සමඟ, 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ආරම්භ වූ දෙවන අදියර තුළින් මුදල් සමාගම් අංශයේ ඔරොත්තු දීමේ හැකියාව සහ කාර්යක්ෂමතාව තවදුරටත් ශක්තිමත් කරමින් 2025 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක වීමට නියමිතය. මාර්ගගත බැංකුකරණය සහ ජංගම ගෙවීම් යෙදුම් හරහා රට තුළ ක්‍රියාත්මක වන ක්ෂණික ගෙවීම් පද්ධතිය වැඩි වශයෙන් භාවිත කිරීම හේතුවෙන් ඩිජිටල් ගනුදෙනුවල සැලකිය යුතු වැඩිවීමක් අපේක්ෂා කරන අතර මධ්‍ය කාලීනව සහ දිගු කාලීනව ගෙවීම් සඳහා මුදල් සහ චෙක්පත් භාවිතය ක්‍රමයෙන් අඩුවනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. ඉදිරි කාලය පුරාවට ඩිජිටල් ගෙවීම් ක්‍රම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීමේ ක්‍රියාමාර්ග වැඩි කිරීමට මහ බැංකුව සැලසුම් කරන අතර ඩිජිටල් ගෙවීම් විසඳුම් ප්‍රවර්ධනය සහ පහසුවෙන් සහ දැරිය හැකි ගෙවීම් සේවා ලබා ගැනීම හා ඒවායේ ආරක්ෂිත භාවිතය සහතික කිරීම සඳහා මහ බැංකුව මූල්‍ය ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ඇත. කෙසේ වුවද, සයිබර් ප්‍රහාර සහ අන්තර්ජාලය හරහා සිදු කෙරෙන වංචා ඇතුළු ගෝලීය අන්තර් සම්බන්ධිතභාවය හා සම්බන්ධ අවදානම් ඉහළ යාම මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවට සැලකිය යුතු අභියෝග එල්ල කරයි. මෙම තාක්ෂණය ආශ්‍රිත අවදානම් අවම කිරීම සඳහා, ගෙවීම් සහ තොරතුරු යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම, ගෙවීම් පද්ධතිවල පාර්ශ්වකරුවන් අතර මනා සහයෝගීතාවයක් ඇති කිරීම සහ පාරිභෝගික දැනුම්වත්භාවය ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, රට තුළ ක්‍රියාත්මක වන ගෙවීම් පද්ධති ශක්තිමත් කිරීම සහ ඒ ආශ්‍රිත අවදානම් අවම කිරීම, සිදු වෙමින් පවතින තාක්ෂණික දියුණුවට සහ වෙනස්වන පාරිභෝගික

ඉල්ලීම්වලට සමගාමීව නීතිමය සහ නියාමන රාමුව යාවත්කාලීන කිරීමට ද අවශ්‍ය වනු ඇත. ඒ අනුව, ගෙවීම් පද්ධති සහ ඒ ආශ්‍රිත ගෙවීම් සේවා සඳහා අදාළ වන නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කරමින් ගෙවීම් සහ පියවීම් පද්ධති සඳහා නව පනතක් ඉදිරියේ දී හඳුන්වා දීමට නියමිත වේ. මෙම පියවර මගින් ශ්‍රී ලංකාවේ ගෙවීම් පද්ධති ස්ථායීතාව සහතික කරන අතර ම, ඩිජිටල් ගෙවීම් භාවිතයේ අඛණ්ඩ වර්ධනය සහතික කරනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

**ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකාව දක්වන කැපවීම නිරූපණය කරමින් 2026 වසරේ දී පැවැත්වීමට නියමිත තුන්වන අන්‍යෝන්‍ය ඇගයීමට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාව මේ වනවිට සූදානම් වෙමින් සිටියි.** මෙම ඇගයීමේ දී ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන වැඩපිළිවෙලෙහි ගෝලීය අනුකූලතාව පවත්වා ගැනීම සහ මූල්‍ය කාර්ය සාධක බලකාය (FATF) විසින් ශ්‍රී ලංකාව අළු ලැයිස්තුගත කිරීමේ අවදානමින් වළක්වා ගැනීම අතිශය වැදගත් වේ. යම් හෙයකින් ශ්‍රී ලංකාව මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් අළු ලැයිස්තුගත කිරීමක් සිදුකළහොත් එය ඉතා අහිතකර ලෙස ශ්‍රී ලංකාවෙහි මූල්‍ය, ආර්ථික තත්ත්වයන්ට මෙන්ම කීර්ති නාමයට ද බලපානු ඇත. තවද, දැනට සකස් කර ඇති මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වූ උපාය මාර්ගවල සමස්ථ බලපෑම තක්සේරු කිරීම සඳහා එකී උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමෙන් පසු විශ්ලේෂණයක් කිරීමටත්, ඉන් පසුව ජාතික මට්ටමේ ඉල්ලුම් පාර්ශ්වීය සමීක්ෂණයක් පැවැත්වීමටත් ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි දෙවන අදියරය, සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්තිමය රාමුවක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර, එය 2026 වර්ෂයේ මැද භාගයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිතය. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවයෙහි සහාය ඇතිව ගොඩනගන ලද තිරසර මූල්‍ය පෙරදැක්ම 2.0, 2025 වසරේ දී දියත් කෙරෙන අතර එය වසර පහක් තුළ ක්‍රියාවට නැංවීමට නියමිතය. එමගින් මූල්‍ය අංශයේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ද ඇතිව තිරසර මූල්‍යකරණයේ පාරිසරික හා සමාජයීය අංශ ආමන්ත්‍රණය කෙරෙනු ඇත.

### 4.2.5 රාජ්‍ය මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම

**ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සහ රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීම සඳහා රජය කැපවීමෙන් සහ නොපසුබට උත්සාහයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.** වාර්ෂික රාජ්‍ය මූල්‍ය උපාය මාර්ග ප්‍රකාශනයක් සහ පස් අවුරුදු මැදි කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවක් ප්‍රකාශයට පත් කිරීම ඇතුළු රාජ්‍ය මූල්‍ය අංශයේ මෙහෙයුම්, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත (රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත) යටතේ නියම කර ඇත. ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ ප්‍රමාණාත්මක ඉලක්ක සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි අවශ්‍යතා සමඟ සමපාත වන පරිදි, ආදායම් මත පාදක වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියක් මත පදනම්ව, වත්මන් රාජ්‍ය මූල්‍ය උපාය මාර්ගය පවත්වා ගෙන යනු ඇත. ඒ අනුව, රජයේ මැදි කාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද 2025 සඳහා වන අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ දක්වා ඇති 2024-2029 මැදි කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවෙහි දක්වා ඇත. 2025 වසර තුළ දී රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 15.0%ක් දක්වා වැඩි කිරීමට සහ තවදුරටත් මැදි කාලීනව එය වැඩිදියුණු කර ගැනීමටත් ප්‍රාථමික වියදම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 13.0%ට වඩා අඩුවෙන් පවත්වා ගැනීමටත් රජය අපේක්ෂා කරයි. සමස්ත අයවැය හිඟය 2026 වසරේ සිට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 5.0%ට වඩා අඩු මට්ටමක පවත්වා ගන්නා අතර අවම වශයෙන් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2.3%ක ප්‍රාථමික අතිරික්තයක් 2025 සහ ඉන් ඉදිරියට පවත්වා ගැනීමට උත්සාහයන් ගනු ඇත. ණය මට්ටම් තිරසාර ගමන් මගකට ගෙන ඒමට සහ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීමෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ නියම කර ඇති පරිදි ප්‍රාථමික වියදම් සඳහා වන රාජ්‍ය මූල්‍ය රීතියට අනුගත වීම සහ ප්‍රාථමික අතිරික්තයක් ළඟාකර ගැනීම ඉතා වැදගත්ය. ඒ අනුව, වත්මන් මැදි කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට අනුව මධ්‍යම රජයේ ණය මැදි කාලීනව ක්‍රමයෙන් තිරසාර මට්ටමකට අඩු කිරීම කෙරෙහි ද අවධානය යොමු කරයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ මාලාව ආර්ථික ස්ථාවරත්වය සහ දිගුකාලීන රාජ්‍ය මූල්‍ය සහ ණය තිරසාරභාවය සහතික කිරීම කෙරෙහි ධනාත්මක ලෙස බලපෑම් ඇති කරමින් පැවැතීම සැලකිය යුතු කරුණකි.


**ඉදිරි කාලය තුළ රජයේ ආදායම් ඉලක්ක කරා ළඟා වීමට මෙන්ම රාජ්‍ය මූල්‍ය අංශයේ අවදානම් අවම කිරීමට දැනටමත් ක්‍රියාත්මක ප්‍රතිසංස්කරණ වැඩසටහනට අඛණ්ඩව ඉදිරියටත් පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ.** ආර්ථික අර්බුදයේ උච්චතම අවස්ථාව මධ්‍යයේ, 2022 වසරේ මැද භාගයේ දී ආරම්භ කරන ලද ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය, සැලකිය යුතු සහ පැහැදිලිව පෙනෙන මට්ටමක ප්‍රතිඵල ලබා දීමට පටන් ගෙන තිබේ. වසර දෙකක් තුළ අඛණ්ඩව පැවති ධනාත්මක ප්‍රාථමික ශේෂ තත්ත්වය, බදු ආදායම් එකතු කිරීමේ සැලකිය යුතු වර්ධනය සහ වියදම් තාර්කිකරණය මගින්, පසුගිය වසර දෙක තුළ රජයේ මූල්‍ය කටයුතු ශක්තිමත් වී ඇති අතර, එය මෑත ඉතිහාසයේ මින් පෙර දක්නට නොලැබූ ආකාරයේ ප්‍රවණතාවකි.

දැනටමත් ප්‍රධාන බදු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කර ඇති බැවින්, බදු ආදායමේ ඉදිරි අපේක්ෂිත වර්ධනය බදු පරිපාලන ප්‍රතිසංස්කරණ තුළින් ලබා ගත යුතුය. මේ සම්බන්ධයෙන්, විශේෂයෙන් ම එකතු කළ අගය මත බදු (Value Added Tax) ගෙවීම් ඉහළ නැංවීම තුළින් බදු අනුකූලතාව වැඩි කිරීම ඉතා වැදගත් වේ. මීට අමතරව, රජයේ ඩිජිටල්කරණ ක්‍රියාවලියට සමගාමීව, සරල කරන ලද පුද්ගල බදු ගොනු කිරීම සඳහා මාර්ගගත ක්‍රමයක් හඳුන්වාදීම, ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) හරහා බදු එකතු කිරීමේ ක්‍රියාවලීන් ඒකාබද්ධ කිරීම, මගින් ආදායම් එකතු කිරීම ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2025 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 15%ක ඉහළ බදු ආදායම් ඉලක්කය කරා ළඟා වීමට, වාහන ආනයනය සඳහා වන සීමා ලිහිල් කිරීමෙන් අපේක්ෂිත ආදායම ඇතුළුව, බදු එකතු කිරීම සැලකිය යුතු ලෙස වැඩි දියුණු කිරීම සඳහා ගන්නා මෙම පියවර අත්‍යවශ්‍යය. මීට අමතරව, රජය සතු ව්‍යවසායයන්හි මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කිරීම, පරිපාලනය ශක්තිමත් කිරීම සහ ඒවායින් රාජ්‍ය මූල්‍ය අංශය වෙත ඇති විය හැකි අවදානම් අවම කිරීම සඳහා රජය සතු ව්‍යවසායයන්වල අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ. රජයේ අවිනිශ්චිත වගකීම් සහ රාජ්‍ය ව්‍යවසායයන් විසින් ණය ගැනීම් ඉහළ යෑම මගින් දේශීය මූල්‍ය පද්ධතියට ඇති විය හැකි පීඩනයන් වළක්වා ගැනීමට, උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු වන මිල යාන්ත්‍රණයන් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.

## 4.2.6 වර්ධන අපේක්ෂා

**සාර්ව ආර්ථික ස්ථායීතාව යථා තත්ත්වයට පත් වීමත් සමඟ, 2024 වසරේ දී සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කළ ශ්‍රී ලංකා ආර්ථිකය, මැදි කාලීනව එහි ධනාත්මක වර්ධන ප්‍රවණතාව පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ආර්ථික හා දේශපාලන ස්ථාවරත්වය, අඩු පොලී අනුපාතික හා අඩු උද්ධමන පරිසරය සහ ආයෝජකයන්ගේ සුභවාදී අපේක්ෂා, මැදි කාලීනව ආර්ථික වර්ධනය වේගවත් කරනු ඇත. විශේෂයෙන් ආනයන සීමා කිරීම් ඉවත් කිරීමෙන් පසු, යෙදවුම් ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු වීමත් සමඟ, කර්මාන්ත අංශයෙහි වර්ධන ප්‍රවණතාව ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂිතය. අඩු පොලී අනුපාත, අමුද්‍රව්‍ය සඳහා ප්‍රවේශය වැඩිදියුණු වීම සහ විදේශ ප්‍රදාන මගින් මූල්‍යනය වන ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු සහ පෞද්ගලික අංශයේ හා නිවාස ඉදිකිරීම් නැවත ආරම්භ කිරීම හේතුවෙන්, විශේෂයෙන් ම ඉදිකිරීම් අංශය ස්ථාවර වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංචාරක කර්මාන්තයේ වර්ධන අපේක්ෂා සහ අනෙකුත්

**4.3 රූප සටහන: කාර්තුමය මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයෙහි පුරෝකථන (වාර්ෂික ලක්ෂ්‍යමය, %)**




**සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ.**
2025 වසරේ මාර්තු මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති දත්ත, උපකල්පන සහ විනිශ්චයන් පුරෝකථන මගින් පිළිබිඹු කරයි.

ව්‍යාප්ති සටහන මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. රූපසටහනේ දැක්වෙන විශ්‍රම්භ ප්‍රාන්තර (Confidence Intervals, CI) මගින් මැදිකාලීන මූර්ත ද.දේ.නි.යේ වර්ධනය විචලනය විය හැකි අගය පරාසයන් දක්වයි. උදාහරණයක් ලෙස, තද නිල් පැහැති ප්‍රදේශය 50% විශ්‍රම්භ ප්‍රාන්තරය නිරූපණය කරන අතර, එමගින් මූර්ත ද.දේ.නි.යේ වර්ධනයේ සැබෑ අගය මෙම පරාසය තුළ පැවතීමේ 50%ක සම්භාවිතාවක් පවතින බව හඟවනු ලබයි. විශ්‍රම්භ පරාසයන් මගින් සාර්ව ආර්ථික විචල්‍යවල දීර්ඝ කාලයකට පුරෝකථනය කිරීමේදී ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයේ ඉහළ යෑම පෙන්නුම් කරයි. නිතර වෙනස්වන ගෝලීය පරිසරය සහ දේශීය ආර්ථිකයේ ඇති අවිනිශ්චිතතා හමුවේ, මූලික පුරෝකථන මත විවිධ ඉහළ යෑමේ හා පහළ යෑමේ අවදානම් ඇති විය හැකිය. සලකන ලද උපකල්පනවල සහ විනිශ්චයන්හි සිදුවන සැලකිය යුතු වෙනස්කම් සැබෑ ආර්ථික වර්ධන මාර්ගය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැක.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

ආශ්‍රිත අංශ වෙත ද එමගින් ඇති කරන ධනාත්මක බලපෑම් හේතුවෙන්, කෙටි කාලීනව සිට මැද කාලීනව, සේවා අංශයේ ඉදිරි ප්‍රවණතා ද යහපත් මට්ටමක පවතිනු ඇත. කෙසේ වෙතත්, 2024 වසරේ අග භාගයේ සහ 2025 වසරේ මුල් භාගයේ ඇති වූ කාලගුණික බාධා හේතුවෙන් කෘෂිකාර්මික අංශය සැලකිය යුතු පසුබෑමකට මුහුණ දුන් අතර, එය එම අංශයේ ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපානු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න අපේක්ෂිත ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම හේතුවෙන් සංකෝචනාත්මක බලපෑමක් ආර්ථිකය කෙරෙහි ඇති කළ හැකිය. එමෙන්ම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න මගින් වැඩිදියුණු වූ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය සහ රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ හේතුවෙන් ඵලදායී පෞද්ගලික අංශය සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් යොමු වීම හේතුකොට ගෙන, ආර්ථික කාර්යක්ෂමතාව සහ ආයෝජකයන්ගේ සුභවාදී අපේක්ෂා ඉහළ නැංවීම මගින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය නිසා ඇතිවන ආර්ථික සංකෝචන බලපෑම් සීමා විය හැකිය.

**අභියෝගාත්මක ගෝලීය පරිසරය තුළ, තිරසාර ලෙස හා සාර්ව සහභාගීත්වයෙන් යුක්තව ආර්ථික වර්ධනය ශක්තිමත් කිරීමට, දීර්ඝ කළක් තිස්සේ සිදුකිරීමට බලාපොරොත්තු වූ ප්‍රතිසංස්කරණ, වඩාත් ශක්තිමත් ලෙස ඉදිරි කාලය තුළ දී සිදු කළ යුතුය.** විශේෂයෙන් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති සහ භූ ආර්ථික ඛණ්ඩනය හේතුවෙන් විදේශ අංශයෙන් මතුවන බාධා දිගට ම පවතී. අපනයන විවිධාංගීකරණය, ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම් ජාලය ශක්තිමත් කිරීම සහ කලාපීය ඒකාබද්ධතාවය වැනි ශ්‍රී ලංකාවේ අපනයන කාර්ය සාධනය වැඩිදියුණු කළ හැකි පියවර හරහා විදේශීය අංශයේ කම්පන වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට ගන්නා ප්‍රයත්නයන්ගේ වැදගත්කම මෙයින් අවධාරණය කෙරේ. වයස්ගත ජනගහනය වැඩි වන පසුබිමක් තුළ, විශේෂයෙන් ම තරුණ හා පුහුණු ශ්‍රමිකයන් ද ඇතුළුව, මෑත කාලීනව විදේශ රටවල් වෙත මෙරටින් සිදු වූ ශ්‍රම ගලනය ආර්ථිකයේ මානව ප්‍රාග්ධන පදනමට යම් අභියෝගයක් එල්ල කරයි. තවද, කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතීම හා උගත් තරුණ පිරිස් අතර ඉහළ විරැකියා අනුපාතය මගින් පිළිබිඹු වන පරිදි, ශ්‍රම සම්පත් උපරිමයෙන් භාවිත නොවීම (ඌන උපයෝජනය), ආර්ථිකය එහි උපරිම ප්‍රගතිය කරා ළඟා වීමට බාධා කරයි. විශේෂයෙන් ම, ශ්‍රී ලංකාවේ වේගයෙන් ඉහළ යන වයස්ගත වන ජනගහනය ද සැලකිල්ලට ගනිමින්, මෙම ගැටලු විසඳීම සඳහා සුදුසු කෙටිකාලීන හා මැදකාලීන ප්‍රතිපත්තිමය පියවර අවශ්‍ය වනු ඇත. ආර්ථිකයේ වර්ධන ගම්‍යතාවයට සම්පූර්ණයෙන් ම දායක වීමට ඇති හැකියාව සීමා කරමින්, ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් දරිද්‍රතාවයේ මායිමේ ජීවත් වන බැවින්, සමාජ ආරක්ෂණ ජාලය සවිමත් කිරීම සඳහා නුදුරු කාලීනව ප්‍රමුඛතාවය දිය යුතුය. ජාත්‍යන්තර කම්කරු නීති හා සමපාත වන පරිදි, පවතින කම්කරු නීති විධිමත් හා නවීකරණය කිරීම මගින් එක් සේවක නීති රාමුවකට අනුගත කිරීම හරහා කම්කරු ඵලදායීතාව සහ සමස්ත ආර්ථික කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අපේක්ෂා කළ හැකිය. තවද, අපේක්ෂිත ඉඩම් ප්‍රතිසංස්කරණ, කර්මාන්ත සංවර්ධනය සඳහා නව ජාතික ප්‍රතිපත්තිය සහ රටේ නිෂ්පාදන හා විදේශීය අංශවල ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමේ මැදි කාලීන උපායමාර්ගික සැලැස්ම මෙන්ම ඩිජිටල් ආර්ථිකයක් ගොඩ නැංවීම සඳහා රජයේ ඇති ශක්තිමත් සැලසුම්, ශ්‍රී ලංකාව නව මානයකට ඔසවා තැබීමට ඒකාබද්ධව සහාය වනු ඇත. මීට අමතරව, අධ්‍යාපනය, කුසලතා සංවර්ධනය සහ පර්යේෂණ සඳහා ආයෝජනය කිරීම මානව සම්පත්වල විභවතාව ළඟා කරගැනීමට ඉතා වැදගත් වන අතර, තාක්ෂණික දියුණුව හරහා විවිධ අංශවල ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා නවෝත්පාදනයන් දියුණු කිරීම අවශ්‍ය වේ. එමෙන්ම, වඩා හොඳ සම්පත් බෙදී යාමක් සහ සේවා සැපයීම සහතික කිරීම සඳහා රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතා ගැටලු විසඳීම ඉතා වැදගත් වේ. තවද, ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ආයතනික ප්‍රතිසංස්කරණ හරහා හිතකර ආයෝජන වාතාවරණයක් නිර්මාණය කිරීම ඉතා වැදගත් වේ. දරිද්‍රතාවයේ විෂම චක්‍රයෙන් මිදීමට හැකියාව ලබා දෙමින්, සමාජයේ වරප්‍රසාද නොලත් කොටස්වලට ඉහළ ආදායම් මට්ටමක් කරා ළඟා වීම සඳහා ආර්ථික අන්තර්ගතභාවය පුළුල් කිරීම සහ බලගැන්වීම කෙරෙහි මෙම ක්‍රියාමාර්ග මගින් අවධානය යොමු කළ යුතුය. තවද, ප්‍රතිපත්ති අනුකූලතාව සහ නිශ්චිතභාවය, තිරසර ලෙස ආර්ථික වර්ධනය පවත්වා ගැනීම සහ ආයෝජක විශ්වාසය ගොඩනැගීම සඳහා තීරණාත්මක වේ. පාලනයේ පවතින පද්ධතිමය දුර්වලතා, දූෂණය සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ගැටලු නිසි කලට විසඳීම, සාර්ව සහභාගීත්වයකින් යුතු තිරසර වර්ධන මාවතක ආර්ථිකය ඉදිරියට යාම සහතික කිරීම සඳහා අතිශයින් වැදගත් වේ.

## 4.3. සමාප්ති සටහන්

***ඉදිරි කාලය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික සමෘද්ධිය බොහෝ දුරට රඳා පවතින්නේ වෙහෙස වී ඇති කරගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සහ වර්ධනය ඉලක්ක කරගත් සුදුසු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මතය. එකිනෙකට නොගැළපෙන ප්‍රතිපත්ති සහ නැවත නැවතත් ප්‍රතිපත්ති ආපසු හැරවීම් හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය අවස්ථා ගණනක දී ම වසර ගණනාවක් ආපස්සට ගමන් කර ඇත. මෑත දී ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් සිදු වූ ආර්ථික පසුබෑම, පුරවැසියන්ට මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා සහ ඉහළ ගොස් ඇති ආර්ථික දුර්වලතා නිසා නවදුරටත් ප්‍රතිපත්තිමය වැරදි සිදු කිරීමට කිසිදු ඉඩක් නොමැත. රාජ්‍ය මූල්‍ය හා ණය තිරසාරභාවය ඇති කිරීම සහ ආර්ථික ස්ථාවරත්වය හා වර්ධනයට බලපෑම් ඇති කරන දිගු කාලීන ව්‍යුහාත්මක බාධක නිවැරදි කිරීම සඳහා අවශ්‍ය රාමුවක්***

වත්මන් ප්‍රතිසංස්කරණ ප්‍රයත්න මගින් සැපයේ. මෙම පසුබිම තුළ, ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ට දිගු කාලීන ප්‍රතිලාභයක් සහතික කිරීම සඳහා, දැනට ක්‍රියාත්මක වන සාර්ව ආර්ථික ගැළපුම් සහ වර්ධනය වැඩිදියුණු කරන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වැඩසටහන දැඩි කැපවීමකින් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වනු ඇත. විශේෂයෙන් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති සහ ගෝලීය වශයෙන් භූ ආර්ථික බෙදී යෑම් වැනි තීව්‍ර වූ අවහිරතා, ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ අවදානම තවත් උග්‍ර කළ හැකිය. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන විවිධාංගීකරණය සහ ගෝලීය හා කලාපීය ඒකාබද්ධතාවය ශක්තිමත් කිරීම තුළින් විදේශීය අංශයේ කාර්ය සාධනය හා ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ වැදගත්කම මෙමගින් නැවත අවධාරණය කෙරේ. මෙය විදේශ විනිමය ඉපැයීමේ ධාරිතාව වැඩිදියුණු කිරීම සහතික කරනු ඇති අතර, බාහිර ස්වාරක්ෂක තවදුරටත් ගොඩනැගීමට සහාය සපයයි. මේ අතර, අර්බුදයෙන් පසු සමයේ ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්වීමේ තිරසාරභාවය රඳා පවතින්නේ නිෂ්පාදන සහ විදේශ විනිමය උත්පාදනය කරන අංශ සඳහා විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට රටට ඇති හැකියාව මතය. විදේශීය මෙන්ම දේශීය ආයෝජකයින් වෙනුවෙන්, දූෂණ අවදානම්වලින් තොර, සාධාරණ සහ ආරක්ෂිත ව්‍යාපාරික පරිසරයක් සහතික කිරීම සහ කාර්යක්ෂම නෛතික පද්ධතියක් ඇති කිරීම සඳහා, ව්‍යාපාර සඳහා සුදුසු පරිසරය වැඩිදියුණු කිරීමේ කඩිනම් ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. විශේෂයෙන් තාක්ෂණය භාවිතා කිරීම, ඩිජිටල් අන්තර්ගතභාවය සහ කුසලතා වර්ධනය හරහා සිදු කෙරෙන ව්‍යුහාත්මක ආර්ථික පරිවර්තන ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ආර්ථිකයේ වර්ධන විභවය පුළුල් කිරීම සඳහා ඉතා වැදගත් වේ. දිගු කාලීන රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය සහතික කිරීම සඳහා රජයට ඉතා කුඩා රාජ්‍ය මූල්‍ය අවකාශයක් තුළ කටයුතු කිරීමට සිදු වී ඇති බැවින්, කෙටි හා මැදි කාලීනව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මගින් ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට ඇති ඉඩ ප්‍රස්තා සීමිතය. එබැවින්, ස්ථාවර ප්‍රතිපත්ති සහ අවශ්‍ය නෛතික, නියාමන සහ ආයතනික සහයෝගය තුළින් පෞද්ගලික අංශයේ සහභාගීත්වයට සහාය දැක්වීම මගින් ආර්ථික ප්‍රසාරණය උත්ප්‍රේරණය කිරීම අත්‍යවශ්‍ය වේ. එම නිසා, මෙම අපේක්ෂිත ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සහ අඛණ්ඩව පවත්වාගෙන යෑම, දේශීය ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා අතිශයින් ම වැදගත් වන අතර, සාර්ව සහභාගීත්වයකින් යුතුව, තිරසාර ආර්ථික වර්ධනයක් කරා රට ගෙනයාමට එය මග පාදනු ඇත.